**ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| **ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව** | **විගණන නිරීක්ෂණය** | **මෙම වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|
| 2.3(අ)(iv) | මුදල් රෙගුලාසි 880 හා 891 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු විධායක තනතුරු 06 කට හා ද්විතියික තනතුරු 03 කට අදාළ නිලධාරීන් 65 දෙනෙකු අදාළ ඇප මුදල් තබා නොතිබුණි. | 2.3(අ)(iii) |

| | |
|---|---|
| 2.7 | 2016 වර්ෂයේ කතරගම බලකා මූලස්ථානයේ පළල අඩි 16 ක් හා දිග අඩි 903 ක් වන ප්‍රධාන අභ්‍යන්තර මාර්ග පද්ධතිය කොන්ක්‍රීට් අතුරා නවීකරණය කිරීම සඳහා ප්‍රදේශයේ පුද්ගලික ආයතනයකින් සිමෙන්ති, ගල්, වැලි ඇතුලු ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේ බිල් පත්‍රයකට රු.584,200 ක් ගෙවා තිබුණු අතර, අදාළ ඉදිකිරීම් ද්‍රව්‍ය මේවන තෙක් කතරගම බලකා මූලස්ථානයට ලැබී නොමැති අතර, එම මාර්ගයේ අලුත්වැඩියාවද සිදුකර නොතිබුණි. |
| 3.7 | ශ්‍රම පිරිවැය හැර රු.මිලියන 11.13 ක වියදමකින් කතරගම බලකා මූලස්ථානයේ සෙසු නිල නිවාඩු නිකේතන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර පලාත් පාලන ආයතනයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, අනුමැතිය ලබාගැනීමෙන් පසුව අනුමැතියකියන් තොරව අවස්ථා කිහිපයකදීම ගොඩනැගිලි සැලැස්ම සංශෝධනය කර තිබුණි. සැලසුම් කළ පරිදි රු. මිලියන 2 ක ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රාදේශීයව සපයාගනු වෙනුවට රජයේ මුදල් වැයකර සපයා ගැනීමට සිදුවී තිබුණු අතර, ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පරිදි මහජන තරඟයට ඉදිරිපත්කර නොතිබුණි. තවද, ඉදිකිරීමට අදාළ අත්‍යාවශ්‍ය ලේඛන නිසි ලෙස යාවත්කාලීනව ගොනුකර නොතිබුණි ඉංජිනේරුවරයෙකුගේ උපදේශයන් සහ අධීක්ෂණයකින් තොරව පැරණි අත්තිවාරමේ කොටසක් ප්‍රයෝජනයට ගැනීම හා ගොඩනැගිල්ලේ බර දරා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා නොගැනීම නිසා ඉදිකිරීම සිදුකරන අතරතුර අඩි 4 ක් උසට බැඳ තිබුණු ගඩොල් බිත්ති කිහිපයක්ම පුපුරා යාම නිසා අමතර වැය බැරක් දරමින් ඒ සඳහා පිළියම් යෙදීමට සිදුව තිබුණි. ඉදිකිරීම් අවසන් කිරීම ප්‍රමාද වීමට මෙය පාදක වී තිබුණි. තවද, දොර ජනෙල් සඳහා භාවිතා කල දැව ගුණාත්මක බවක් නොතිබුණු අතර නාන කාමරවල කාන්දුවීම් නිරීක්ෂණය විය. |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෘෂි සත්ත්ව හා වෙනත්, සංගීත හා නර්තන, ආරක්ෂක සේවා, ඉදිකිරීම් හා නඩත්තු සේවා යන ආදායම්වලින් දෙපාර්තමේන්තුව | දෙපාර්තමේන්තුව වෙත ආදායම් | දෙපාර්තමේන්තු වට වෙනම |

| | | |
|---|---|---|
| සැලකිය යුතු ආදායමක් රැස්කරන අතර, සමාලෝචිත වර්ෂයේදීද එම ආදායම් ප්‍රභවයන්ගෙන් එකතුව රු. මිලියන 1,565 ක ආදායමක් රැස්කර තිබුණි. වාර්ෂිකව උපයනු ලබන මෙම ආදායම් ගිණුම් ගත කිරීමට සමාලෝචිත වර්ෂයේද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කේතයක් ලබා ගැනීම සඳහා, අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත, ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. |

**(ආ) දේපළ පිරියත හා උපකරණ**

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පවරා ගැනීම් කටයුතු අවසන් නොකරන ලද බිම් කැබලි 299 තුළ දෙපාර්තමේන්තුව විසින් ඉදිකරන ලද ගොඩනැගිලි 404 ක වර්ග අඩි 119,581 ක ගොඩනැගිලිවල වටිනාකම් තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | පවරා ගැනීමට හැකියාව ඇති බිම් කැබලි අයත් ආයතන වෙත පවරා ගැනීම් කටයුතු සඳහා අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති බව. | අදාළ වත්කම් ලේඛනගත කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ii) | මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් **ACA** 6 ආකෘතිය තුළ දක්වා තිබූ වාහන තුළ එකම වාහන අංකයෙන් අවස්ථා 2 කදී වාහන වටිනාකම් ඇතුළත්කර තිබූ අවස්ථා 30 ක් නිරීක්ෂණය වූ අතර, ඒ අනුව ද්විගණනය වී තිබුණු වාහන වටිනාකම රු.මිලියන 53 ක් විය. | දෙපාර්තමේන්තුව සතු නවාහන නිවැරදිව හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගැනීමටත් ඒ අනුව ගිණුම් නිවැරදි කිරීමටත් උපදෙස් ලබාදී ඇති බව. | ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව නඩත්තු කළ යුතු වීම. |
| (iii) | දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන වාහන 64 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව . | නිවැරදිව තක්සේරුකර ගිණුම්ගත කළ යුතු වීම. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් විකුණා තිබූ වාහන 20 ක් අතුරින් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත්කර තිබූ වාහන 6 ක් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතුකර නොතිබුණි. තවද, ඉතිරි වාහන 14 ට අදාළව දෙපාර්තමේන්තුවට ලැබීම් හා විකිණීම් යන ගණුදෙනු දෙකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ අග භාගයේදී මෙම වාහන අපහරණය සිදු කළ අතර, 2023 වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදිව ඇතුලත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ගණුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |
| (v) | 2022 වර්ෂයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් දෙපාර්තමේන්තුවට ලද කාබනික පොහොර නිෂ්පාදනයට අදාළ යන්ත්‍ර 11 ක්, ලීටර් | පවරාගෙන අවසන් කර ඇති ඉඩම් කැබලි 31 හා එහි ඇති ගොඩනැගිලිවල | නිවැරදිව තක්සේරුකර ගිණුම්ගත කළ යුතු |

| | | | |
|---|---|---|---|
| | 5000 ජල ටැංකි 06 ක්, විවිධ කටයුතු සඳහා භාවිතා කරන තවත් යන්ත්‍ර 07 ක්, ඩිජිටල් තරාදියක් හා ග්‍රීස් පොම්පයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුලත්කර නොතිබුණි. | වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය තක්සේරු වටිනාකම් ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මේ වනවිට යොමුකර ඇති බව. | වීම. |
| (vi) | දෙපාර්තමේන්තුව විසින් පවරා ගැනීම් අවසන් කරන ලද ඉඩම් කැබලි 31 ට අදාළ හෙක්ටයාර් 11.0716 ක ඉඩම් ප්‍රමාණය හා එම ඉඩම්තුල පිහිටි ගොඩනැගිලි සමාලෝචිත වර්ෂය අවසන්වන විටද තක්සේරුකර ලේඛනගතකර නොමැති අතර, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයටද ඇතුලත්කර නොතිබුණි. | 2022.12.31 වන දින වන විට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව පරිහරණය කරනු ලබන කාර්යස්ථාන 555 න් 31 විධිමත්ව පවරා ගන්නා ලදී. ඉතිරි බිම් කැබලි ප්‍රමාණයෙන් ඉඩම් කැබලි 299 ක ප්‍රමාණයක් විධිමත්ව පවරා ගත හැකි යැයි හඳුනාගත් අතර, එය පවරා ගැනීම වෙනුවෙන් එම බිම් කැබලි අයත් ආයතන සඳහා ලිපි ඉදිරිපත් කර ඇති බව. | කඩිනමින් නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට සපයනු ලැබූ ආරක්ෂක හා වෙනත් සේවාවන් ඉටුකර දීම වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු නමුත් එකතුව රු.මිලියන 334 ක හිඟ ආදායම් 2023 මාර්තු මස 24 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | දෙපාර්තමේන්තුව මේ වන විටත් සැළකිය යුතු හිඟ ආදායමක් අයකරගෙන ඇති අතර, ඉතිරි හිඟ ආදායම්ද කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අදාළ හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වීම. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර තිබූ රු. මිලියන 112.28 ක් වටිනා බැඳීම් හා බැරකම් 2023 වර්ෂයේ මාර්තු මස අවසන් වන විටද පියවා නොතිබුණි. | බිල්පත් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරය වෙතින් අත් මුදල් නොලැබීම නිසා බිල්පත් නිරවුල් කිරීමට නොහැකි වූ බව. | කඩිනමින් බැරකම් බේරුම් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | | |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>------------------ | | | |
| | xxviii පරිච්ඡේදයේ 1.3 | දෙපාර්තමේන්තුවේ හට/ හටවරියන් 2569 ක් දිවයිනේ විවිධ ප්‍රදේශවල විහාරස්ථාන/පුරාවිද්‍යාස්ථාන ඇතුලු පූජනීය ස්ථාන වෙත විවිධ රාජකාරී කටයුතු සඳහා දීර්ඝ කාලයක සිට අනුයුක්ත කර ඇති අතර, එම හට/හටවරියන්ගේ පැමිණීම පිටවීම විධිමත් අධීක්ෂණයකින් තොරව 2022 වර්ෂයේදී වැටුප් ලෙස රු.මිලියන 1,294.78 ක මුදලක් ගෙවා තිබුණි. | අදාළ හට හටවරියන් බලකායේ අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ සේවය කරනු ලබන බවත්, අණදෙන නිලධාරීගේ සහතිකයමත වැටුප් ගෙවීම සිදුකරනු ලබන බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව පැමිණීම පිටවීම නිවැරදිව සිදුකල යුතුවීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 104(3) (4) | මිහින්තලය බලකා මූලස්ථානයට අයත් කැබ් රථයකට 2021 දෙසැම්බර් 14 දින යාන්ත්‍රික වශයෙන් අලාභ හානියක් සිදු වී තිබුණි. එම අලාභහානිය අලුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 1.06 ක මුදලක් වැයවන බවට තක්සේරුකර ඇති අතර, එම හානිය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් දින 07 ක් ඇතුලත නිකුත් කිරීමට කටයුතුකර නොතිබුණු අතර, 2023 මාර්තු 31 දිනවන විටත් පරිපූර්ණ වාර්තාද ඉදිරිපත්කර නොතිබුණි. | ඉදිරියේදී මුදල් රෙගුලාසිවල නියමිත කාලරාමුව තුල වාර්තා ලබා ගැනීම සඳහා අභ්‍යන්තර ක්‍රියා මාර්ග ගෙන ඇති බව. | අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371(5) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 37 කදී නිලධාරීන් 15 දෙනෙකුහට ලබාදී තිබුණු එකතුව රු.මිලියන 2.17 ක් වූ අත්තිකාරම් දින 12 ත් 207 ත් අතර, ප්‍රමාදයකින් යුක්තව පියවා තිබුණි. තවද, යම් නිලධාරියෙකු ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීමට පෙර නැවත අත්තිකාරම් මුදලක් නොගෙවිය යුතු නමුත් ඊට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් 6 දෙනෙකුට අවස්ථා 19 කදී රු.මිලියන 1.12 ක අත්තිකාරම් 2022 වර්ෂයේදී ලබාදී තිබුණි. | මෙම තත්ත්වය මඟ හැරවා ගැනීම සඳහා සියළුම අධ්‍යක්ෂකවරුන් සහ සියළුම නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වෙත උපදෙස් ලබාදී ඇති බව. | අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (iii) | මුදල් රෙගුලාසි 880 හා 891 | දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු විධායක තනතුරු 06 කට හා ද්විතීයික තනතුරු 03 කට අදාළ නිලධාරීන් 58 දෙනෙකු අදාළ ඇප මුදල් තබා නොතිබුණි. | දැනට සිටින සියළුම නිලධාරීන්ට ඇප තැන්පත් කරන ලෙස උපදෙස් ලබාදී ඇති බව. | අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ භටයින්ගේ නිලඇඳුම් මසා නිම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන අනුරාධපුර රඹෑව බලකායේ මැහුම් ව්‍යාපෘතිය, ඉදිකරමින් පවතින ඇඟළුම් කර්මාන්තශාලා ගොඩනැගිල්ලෙහි බිම් මහලෙහි 2016 අප්‍රේල් 03 දින සිට වර්ෂ 06 ක පමණ කාලයක් තිස්සේ පවත්වා ගෙන ගොස් තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | | |
| (අ) | අවශ්‍ය අමුද්‍රව්‍ය නොලැබීම හේතුවෙන් 2022 පෙබරවාරි මාසයේ සිට විගණන දිනය වූ 2022 සැප්තැම්බර් 27 දින දක්වා මාස 08 ක පමණ කාලයක් තිස්සේ තාවකාලිකව වැඩ නවතා දමා තිබුණි. | නිළ ඇඳුම් රෙදි ප්‍රසම්පාදනය කර ගැනීම සඳහා බාධා පැමිණීම නිසා ඇඟලුම් කම්හලේ නිෂ්පාදන කටයුතු මාස 08 ක කාලයක් සීමා කිරීමට සිදු වූ අතර, එම හේතූන් අපගේ පාලනයෙන් බැහැර වූ ඒවා බව. | ඇඟලුම් කම්හලේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය කල්වේලා ඇතිව ප්‍රසම්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෙම මැහුම් මධ්‍යස්ථානය තුළ ඒ සඳහා යොදාගන්නා යන්ත්‍රසූත්‍ර 54 ක්, වායු සමීකරණ යන්ත්‍ර 06 ක්, විදුලි පංකා 13 ක්, අමු ද්‍රව්‍ය තොග ඒකක 164,202 ක් සහ අමතර කොටස් හා උපාංග ඒකක 1247 ක් මාස 08 ක පමණ කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. මේවා මෙසේ නිෂ්කාර්යව පැවතීමෙන් නැවත භාවිතා කිරීමේදී විවිධ කාර්මික ගැටළු ඇතිවීමට හැකි බව නිරීක්ෂණය කෙරේ. | මසකට දෙවතාවක් වායු සමීකරණ හා විදුලි පංකා සේවා කර පිරිසිදු කරන බව සහ මෙම වර්ෂය තුල අමුද්‍රව්‍ය උපයෝජනය කිරීමට අපේක්ෂා කරන බව. | වත්කම් නිෂ්කාර්යව පවත්වා නොගත යුතු අතර, ඒවා නිසි කාර්යක්ෂමතාවයකින් යුක්තව භාවිතා කල යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 4.2.1 (ඇ) පරිදි ඊලඟට එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වුවද, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 2022 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 854 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදනය කර ගන්නා භාණ්ඩ හෝ සේවා ඒකක ප්‍රමාණයක් දක්වා නොතිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණය පුරෝකථනය කල නොහැකි බැවින් වසර 3 ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගිකව අපහසු කාර්යයක් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව සැලසුම් කළ යුතු වීම. |
| (ආ) | රු.මිලියන 6.36 ක් වටිනාකමින් යුත් ටයර්, ටියුබ් සහ කොලර් මිලදී ගැනීමේදී, රු.මිලියන 1.8 ක් වටිනා පරිගණක සහ ලේසර් පොයින්ටර් 01 මිලදී ගැනීමේදී සහ රු.මිලියන 1.07 ක් වැයකර ජල බෝතල් 60000 ක් මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 වගන්තිය ප්‍රකාරව කාර්ය සාධනය අසාර්ථකවන අවස්ථාවන්හිදී ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂාකර ගැනීම සඳහා කාර්ය සාධන බැදුම්කරයක් ලබා ගැනීමකින් තොරව ගිවිසුම් අත්සන්කර මිලදී ගැනීම් සිදුකර තිබුණි. | 2022.01.01 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛ මුදල් 01/2022 හි ඡේද අංක 1.8 අනුව රුපියල් මිලියන 02 කට වැඩි වටිනාකමින් යුතු මිළදී ගැනීම් සඳහා පමණක් කාර්යසාධක සුරක්ෂිතයක් ගත යුතු බව දන්වා ඇත. තවද 5.4.10 ‘අ’ පරිච්ඡේදය අනුව අදාල භාණ්ඩයේ වෙලඳපල තත්ත්වයමත හා වාණිජමය පරිචයමත ප්‍රසම්පාදන අස්තිත්වය විසින් කාර්යය සාධන සුරක්ෂණයක් ලබා ගෙන නොමැති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 5.91 ක් වැයකර කොන්ඩච්චිය කජු ව්‍යාපෘතිය සඳහා Acetamiprid insecticide කි.ග්‍රෑම් 540 ක් මිලදී ගැනීමේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) ඡේදය පරිදි විෂය විශේෂඥයෙකුගෙන් සහ ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ඇති අවම වශයෙන් එක් සාමාජිකයෙකුගෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත යුතු වුවත් මේ සඳහා සහභාගී කරගත් තාක්ෂණික ඇගයීම් කමිටුව මෙම අවශ්‍යතා සපුරා ඇති බව විගණනයේදී තහවුරු නොවුණි. | කෘමිනාශක ආනයනය කිරීමට පැවති දැඩි බාධාවන්මත සහ එවකට කජු ව්‍යාපෘතිය හෙලෝපෙල්ටීස් රෝගයට ගොදුරුවීමේ වැඩි ප්‍රවණතාවයක් පැවති අතර, එම රෝගය පාලනයට සහ රෝගයේ ව්‍යාප්තිය පාලනය සඳහා ප්‍රමාණය වැඩිකර මිලදී ගැනීම සිදු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වීම. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ ශ්‍රම පිරිවැය නොමැතිව රු. මිලියන 15.37 ක ඇස්තමේන්තු වියදමක් යටතේ අනුරාධපුර රඹෑව බලකායේ 115'x38' ප්‍රමාණයේ දෙමහල් ඇඟළුම් කර්මාන්තශාලාවක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණු නමුත් විගණන දිනය වන 2022 සැප්තැම්බර් 27 දින වන විටත් අදාළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. | යොමුකර ඇති විගණන නිරීක්ෂණ සම්බන්ධව තීරණයක් ගැනීමට මා විසින් 2023.02.20 දින කමිටුවක් පත්කර ඇත. එම කමිටු වාර්තාව ලබා ගැනීමෙන් අනතුරුව මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධව ඉදිරි කටයුතු කරන බව. | සැලසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු නිම කළයුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට දිවයිනේ විවිධ ප්‍රදේශවල පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 555 කින් 2022 දෙසැම්බර් 31 දිනවන විටත් බිම් කැබලි 31 ට අදාළ හෙක්ටයාර් 11.0716 ක ඉඩම් ප්‍රමාණයක් පමණක් පවරා ගැනීමට කටයුතුකර තිබූ නමුත් ඉතිරි බිම් කැබලි 524 ක ප්‍රමාණය විගණිත දිනය වන 2023 මාර්තු 31 දින වන විටත් පවරා ගැනීම් කටයුතු අවසන්කර නොතිබුණි. | ඉඩම් කැබලි 299 ක ප්‍රමාණයක් විධිමත්ව පවරා ගත හැකි යැයි හඳුනාගත් අතර, එය පවරා ගැනීම වෙනුවෙන් එම බිම් කැබලි අයත් ආයතන සඳහා ලිපි ඉදිරිපත් කර ඇති බව. | කඩිනමින් නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | විවිධ අමාත්‍යාංශවලට හා දෙපාර්තමේන්තු වලට අයත් ඩිෆෙන්ඩර් රථයක්, ජීප් රථ 03 ක්, වෑන් රථයක්, ත්‍රී රෝද රථයක්, යතුරුපැදි 05 ක්, ට්‍රැක්ටර් 02 ක් හා ට්‍රැක්ටර් ටේලර් 03ක් ලෙස වාහන 16 ක් දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් තිබෙන නමුත්, එම වාහන වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | පැවරීම සඳහා ඉදිරි කටයුතු ක්‍රියාත්මක කර ඇති බව. | නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ කුරගල බලකායේ සිදු වූ කෝන්ගල බිම්තැන්න තලනබටු වගාව විනාශ වීම හා 2020 වර්ෂයේ අක්කර 3.5 ගස්ලබු වගාව විනාශ වීම යන වගා හානි දෙකක් සම්බන්ධයෙන් 2023 මාර්තු 27 දින වන විටත් අලාභයන් තක්සේරුකර ලේඛනගතකර නොතිබුණි. | කුරගල බලකායේ සිදුව ඇති අලාභයන් 02 සම්බන්ධව 2022.04.05 වන දින මණ්ඩල පත්කර ඇත. මණ්ඩල වාර්තාව ලද පසු ඉදිරි කටයුතු සිදු කරන බව. | අදාළ හානි සම්බන්ධයෙන් සිදු වී ඇති අලාභයන් තක්සේරුකර ලේඛනගත කළයුතු වීම. |
| (ආ) | මු.රෙ.110 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ සිදුවූ හානි යාවත්කාලීනව හානි පිළිබඳ ලේඛනයක සටහන්කළ යුතු වුවත්, 2021 වර්ෂයට අදාළ රු. මිලියන 4.94 ක් වටිනා කෘෂි හානි දෙකක් 2023 මාර්තු 27 දින වන විටත් හානි පාඩු ලේඛනයේ ඇතුලත්කර නොතිබුණි. | 2022.01.01 වන දින සිට නිවැරදිව හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමට පියවර ගන්නා ලද අතර, ඊට පෙර වර්ෂයන්හි සිදුවන ලද හානි හා පාඩු සම්බන්ධව තොරතුරු ඇතුලත් කිරීමේදී මොණරාගල බලකායේ හානි හා පාඩු සම්බන්ධ තොරතුරු සටහන් කිරීම අතපසු වී ඇත. එම අතපසුවීම 2023.03.31 දින හඳුනාගන්නා ලද අතර, එය හානි පාඩු ලේඛනයේ අංක 09 හා 10 යටතේ සටහන් කිරීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිවැරදිව හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | මහඔය බලකාය යටතේ බක්කිඇල්ල අනුකලාපයේ 2010 හා 2012 වර්ෂයන්හි පවත්වාගෙන ගොස් තිබුණු ගඩොල් ව්‍යාපෘතීන්හි ඇති වී තිබුණු ගඩොල් 762,322 ක ඌණතාවයක් නිසා රු.මිලියන 5.45 ක පාඩුවක් සිදුවී තිබුණි. 2023 අප්‍රේල් 10 දින වන විට ඉන් රු.මිලියන 2.55 අය කර ගැනීමට කටයුතු කර තිබුණු නමුත් රු.මිලියන 2.9 ක් වූ ඉතිරි මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | සියළු අයකිරීම් අඛණ්ඩව සිදු කිරීමට නියෝග ලබා දී ඇති බව. | ඌනතාවය කඩිනමින් අය කළයුතු වීම. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මියගිය නිලධාරීන් 31 දෙනෙකුගෙන් අයවිය යුතු රු. මිලියන 3.36 ක් වූ ණය අයකර ගෙන නොතිබුණු අතර, ඒ තුළ රු. මිලියන 2.1ක් වූ වසරකට වඩා පැරණි ණය ශේෂයන් ද සේවය හැර ගිය නිලධාරීන් 195 ක ගෙන් රු. මිලියන 14.37 ක ණය ශේෂ පැවති අතර, ඒ අතරින් වසර 04 කට වඩා පැරණි ණය ශේෂ රු.මිලියන 5.26 ක් හා වසර 03 කට වඩා පැරණි ණය ශේෂය රු.මිලියන 4.12 ක් වූ ණය ශේෂයක්ද නිලධාරීන් 200 දෙනෙකුගෙන් 2022 වර්ෂය ආරම්භ වන විට අයවිය යුතුව පැවති එකතුව රු.මිලියන 29.95 ක් වූ ණය ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මියගිය නිලධාරීන් 31 දෙනෙකුගේ පාරිතෝෂිත මුදලින් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර ඇත. එම මුදල් ලද පසු ගිණුම් ගැලපීම් සිදු කරනු ලබන බව හා ණය ශේෂ අය කර ගැනීම සම්බන්ධව කමිටුවක් මගින් ණය ශේෂවල නිවැරදිතාවය පරීක්ෂාකර සත්‍යතාවය තහවුරු කර ගෙන අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව කරුණු සොයා බලමින් පවතින බව ද ණය ශේෂ අය කර ගැනීම සම්බන්ධව කමිටුවක් මගින් ණය ශේෂවල නිවැරදිතාවය පරීක්ෂාකර සත්‍යතාවය තහවුරු කර ගෙන අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව කරුණු සොයා බලමින් පවතින බවයි. | අදාළ මුදල් කඩිනමින් අයකර ගත යුතු වීම. |
| (ආ) | කැබිතිගොල්ලෑව බලකායේ ක්‍රියාත්මක හරිතාගාර මිරිස් ව්‍යාපෘතිය සඳහා අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගැනීමකින් තොරව මිලදී ගෙන තිබූ විවිධ වර්ගයේ උපකරණ හා ද්‍රව්‍ය අයිතම 20 කට අදාළව රු. මිලියන 4.47 ක් වටිනා අයිතම් වර්ග 1,045 ක ප්‍රමාණයක් 2022 වර්ෂයේ සිට විගණිත දිනය දක්වා එනම් වර්ෂයකට ආසන්න කාලයක් අදාළ බලකායේ කිසිදු ප්‍රයෝජනයකින් තොරව නිශ්කාර්යව ගබඩාකර තිබුණි. | මෙම ව්‍යාපෘතිය මේ වන විට කැබිතිගොල්ලෑව බලකායට අමතරව, තවත් බලකායන් 10ක ක්‍රියාත්මක කරනු ලබන අතර, උක්ත අයිතමයන් එම බලකායන් හි අවශ්‍යතාවය පරිදි නිකුත් කිරීමට කටයුතු කර ඇති බව. | කඩිනමින් උපයෝජනය කිරීමට කටයුතු කලයුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(අ)</td><td>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සෙසු නිල හා භට/භටවරියන්ගේද පුරප්පාඩු 6,349 ක් පැවතුණි.
<table>
<tr><th>විස්තරය</th><th>අනුමත සංඛ්‍යාව</th><th>තත්‍ය සංඛ්‍යාව</th><th>පුරප්පාඩු සංඛ්‍යාව</th></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ මට්ටම</td><td>23</td><td>18</td><td>05</td></tr>
<tr><td>තෘතික මට්ටම</td><td>84</td><td>71</td><td>13</td></tr>
<tr><td>ද්විතීක මට්ටම</td><td>126</td><td>73</td><td>53</td></tr>
<tr><td>ප්‍රාථමික මට්ටම(ස්ථිර)</td><td>39,960</td><td>33,682</td><td>6,278</td></tr>
<tr><td>වෙනත්(අනියම් /තාවකාලික/ කොන්ත්‍රාත්)</td><td>-</td><td>07</td><td>-</td></tr>
<tr><td>එකතුව</td><td><u>40,193</u></td><td><u>33,851</u></td><td><u>6,349</u></td></tr>
</table></td><td>ගණන්දීමේ නිලධාරී අදහස් දක්වා නොමැත.</td><td>පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැලපෙන ලෙස අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.</td></tr>
<tr><td>(ආ)</td><td>දෙපාර්තමේන්තුවේ 33,851 ක් වූ සමස්ථ කාර්ය මණ්ඩලයෙන් සමාලෝචිත වර්ෂයේ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී තිබුණේ 1,330 දෙනෙකු පමණි.</td><td>පැවති වසංගත තත්ත්වය හා එම සමයේ රටේ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් සැලසුම් කළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර, මේවනවිට (2023) පුහුණු අංශය මඟින් සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් පවත්වාගෙන යන බව.</td><td>සේවක පුහුණුව තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නංවාගැනීමට කටයුතු කළයුතු වීම.</td></tr>
</table>